


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ බක් මස කලාපය, රා. ව. 2017 ක් වූ අප්‍රේල් මස 10 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

## බාහිර ආගමික ආකල්ප දුරු කරමු. සද්ධර්මය අතුරුදහන් නොකරමු.

**ධම්කාමී පින්වතුනි,**

**අද බක්මස පුර පසළොස්වක පොහෝ දිනයයි. මහ බෝසතුන් වහන්සේ දුටු පෙර නිමිති සතරින් පළමු පෙර නිමිත්ත දුටුවේ අද වැනිපොහෝ දිනයකය. සම්බුදු තෙමගුල සැමරීමට මාසයක කාලයක්ද සිංහල හිඳු අළුත් අවුරුද්ද උදා වීමට දින කීපයක් ද තිබියදී අද පෝදා දහම් පණිවුඩයේ මාතෘකාව කරගන්නා ලද්දේ සූත්‍රපිටකයට අයත් සංයුත්ත නිකායේ ඕපම්ම සංයුත්තයේ "ආණි සූත්‍රයයි." භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන විහාරයේදී. භික්ෂුන් වහන්සේ අමතා පෙර කාලයකදී සිදු වූ සිද්ධියක් සිහිපත් කරනව. එකල ක්ෂත්‍රිය රාජ පුත්‍රයින් සතු අණ බෙරයක් විය. එය ආණක සහ මංගල බෙරය නමින්ද ප්‍රකට විය. එහි හඬ යොදුන් දෙළහක් දුරට ඇසේ. කලක් යන විට භාවිතය නිසාම එම බෙරකඳ පැලීමක් හටගෙන ඊට පිළියම් වශයෙන් ඇණයක් ගසන ලදී. මෙසේ දිගින් දිගට පැලීම සහ ඇණ ගැසීම නිසා පැරණි බෙරකඳ අතුරුදහන් වී ඇණ සැකිල්ලක් දිස්විය. හඬද බාලවිය. මෙය උපමාකොට බුදුහාමුදුරුවො වදරණව මතු කාලයෙහි භික්ෂූන් වෙති. ඔවුන් තථාගතයන් වහන්සේ වදාළ ගැඹුරු අර්ථ ඇති ලොවුතුරා අර්ථ සාධන සසර දුකින් සත්වයා එතෙර කරන බුද්ධ වචනය දෙසන කල්හි ඇසීමට අකමැති වේ. ඇහුම්කන් නොදී අවබෝධයට හිත නොයොදවයි. ඉගෙනීමට පාඩම් කිරීමට නොසිතයි. එනමුත් ඒ වෙනුවට වෙනත් දක්ෂ කවීන් පද බැඳීම් දන්නා අය විසින් අක්ෂර පද ව්‍යඤ්ජන සහිතව තථාගත ශාසනයෙන් බැහැර වූ ශාස්තෘ වරුන්ගේ ශ්‍රාවකයින් දෙසන ලද යමක් වේද ඒවා කියන දෙසන කල්හි ඇසීමට කැමතිවේ. කන්යොමු කරයි. සිත යොමු කරයි. එම දහම් ඉගෙන පාඩම් කරගත යුතු යයි සිතති. මෙසේ තථාගතයන් වහන්සේ විසින් වදරණ ලද ගැඹුරු අර්ථ ඇති ලොව්තුරා සද්ධර්මය අතුරුදහන් වන බව වදාළහ. එම හේතුව නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් තම ශ්‍රාවකයින්ට අවවාද කරනව ලොව්තුරා අර්ථය දැක්වෙන ධර්මය දේසනා කරන කල්හි එය ඇසීමට කැමති වෙමු. කන් යොමු කරමු. සිත යොමු කරමු. ඒ ධර්මයම දැන ඉගෙන දරමු යයි මෙසේ හික්මෙමු යයි උනන්දු කරනව.**

මෙහිදී ආරම්භයේදීම "මහණෙනි මතු කාලයෙහි භික්ෂූහු ධර්මය අසනු කැමති නොවේ...." යනුවෙන් දැක්වේ. ඒ හැම අතින්ම තථාගත සාසනයෙහි භික්ෂූන් වහන්සේලාම ඉදිරිපෙළ ශ්‍රාවක සමූහයා වූ බැවිනි. එනමුත් සිවු පිරිසටම මෙය බලපානු ඇත. සසුනෙන් පරිබාහිරවූ විසිතුරු අක්ෂර පද ව්‍යඤ්ජන සහිත ශ්‍රවණ මාධූර්ය ඇතිව පතුරුවන අනර්ථ වූ ධර්මයන්ගේ සුන්දරකම නිසා බොහෝ දෙනා ඇසීමට ප්‍රියවෙති. වර්තමානයේ වුවද බොහෝ දෙනා එවැනි යමක් ඇසේ නම් ඉතා ප්‍රියවේ. ඒ වටා රොක් වීමෙන් මේ ධර්මයක්ය. ධර්ම කථිකයෙකිය. තථාගත ධර්මය යයි සිතා අසති. එය ලෝකයේ සාමාන්‍ය සවභාවයකි. එසේ අසනුයේ සාමණේර තරුණ භික්ෂූන් වහන්සේ සහ ස්ත්‍රී පුරුෂ ගිහියන් මහා ධනවත් ගෘහපතීහු යයි සූත්‍රයේ අර්ථ දැක්වේ. ක්ෂත්‍රියයන් සතු ආණක නම් වූ අණබෙරය ඇණයෙන් පිරුනේ කාලයාගේ ඇවෑමෙනි. බුද්ධ අඟුව හෙවත් ශ්‍රී සද්ධර්මය ශ්‍රාවකයාට ලැබෙනුයේ ධම්දේශණාව මගිනි. ඒ ධර්ම සන්නිවේදන ක්‍රමයයි. එයට සිත් ගන්නා සුලු වෙනත් ආගමික දේසනා මිශ්‍රවීමෙන් කාලයාගේ ඇවෑමෙන් වඩා වර්ධනය වීමෙන් ඒවා බැබලේ. පිරිසිදු දහම අතුරුදහන් වනුයේ පළමුවෙන් තිබූ බෙරකඳ ඇණ හේතුවෙන් අතුරුදහන් වූවාසේය. තථාගත සාසනයේ සිවුපිරිසම මේ පිළිබඳව සිහිනුවනින් කටයුතු කරනතුරු එසේ අතුරුදහන් නොවේ.

බුද්ධත්වයට පත්වූ අළුත මාරයා පැමිණ භාග්‍යවතුන් වහන්සේට කියනව දැන් පිරිනිවනට පත්වීමට කාලය පැමිණ ඇතිබව. මරුහට දුන් පිළිතුර බුදුහිමියන් මහා පරිනිබ්බාන සූත්‍රයේදී මෙසේ වදාළහ. "පාපී මාරය මගේ ශ්‍රාවක වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සතර පිරිස ව්‍යක්ත, විනීත, විසාරද, බහුශ්‍රැත, ධම්ධර, ධම්මානුධම් ප්‍රතිපන්න නොවන්නාහුද තම ගුරු උපදෙස් ඉගෙන නොගනීද, ඒවා නොකියයිද, නොදෙසයිද, නොපනවයිද, නොපිහිටුවයිද, විවෘත නොකරයිද, බෙද නොදක්වයිද, ප්‍රකට නොකරයිද, පිටතින් පැමිණෙන පර අදහස් නිග්‍රහකොට නිවනට හේතුවන ධම්ය මතු නොකරයිද ඒතාක් මම පිරිනිවන් නොපාමි යනුවෙන් වදාළහ. එයින් පැහැදිළි වන්නේ ශ්‍රී සද්ධම්ය සිව්පිරිසම මැනවින් පරිහරණය කිරීමෙන් අතුරුදහන් කිරීමට මාරයාටද නොහැකි බවයි.

වර්තමානය වනවිට සද්ධර්මයේ නාමයෙන් ඉහතකී විසිතුරු වූ ආකාරයෙන් වෙනත් ආගමික මූළාශ්‍ර බෞද්ධ ජනතාව තුළ නොදැනුවත්වම ක්‍රියාත්මක වනබව අප හොඳින් දනිමු. සද්ධම්ම පතිරූපක සූත්‍රයට අනුව "සද්ධර්මය වගේ යමක් ලොව පහළ නොවේද ඒතාක් සද්ධර්මයේ අතුරුදහන් වීම නොවේ. ලොව යම් කලෙක ධර්මය වගෙ යමක් පහළවේද එකලට සද්ධර්මයේ අතුරුදහන් වීම වේ." යනුවෙන් වදාළ බැවින් එවැනි යමක් වෙනව නම් එය හඳුනා ගැනීමට හැකියාව සිව් පිරිස තුළ හැමද පැවතිය යුතුය. එම සූත්‍රයේ දැක්වෙන පරිදි සතර මහා ධාතූන් නිසා සද්ධර්මය අතුරුදහන් නොවන බවද මේ සසුනෙහි හිස් පුරුෂයන් පහළ වීමෙන් ධම්ය අතුරු දහන් වන බවද දැක්වේ. හිස් පුරුෂයන් පහළවන්නේ දහම අතුරු දහන් වන්නේ

ඝ්ඩ් බුද්ධ රත්නය කෙරෙහි ගෞරව යටහත් පැවතුම්නැති අය නිසාය.

ඝ්ඩ් ධම්ම රත්නය කෙරෙහි ගෞරව යටහත් පැවතුම්නැති අය නිසාය.

ඝ්ඩ් සංඝ රත්නය කෙරෙහි ගෞරව යටහත් පැවතුම්නැති අය නිසාය.

ඝ්ඩ් ශික්ෂාව හෙවත් සීලය කෙරෙහි ගෞරව යටහත් පැවතුම්නැති අය නිසාය.

කඩ සමාධිය හෙවත් සිතේ සන්සුන් කම කෙරෙහි ගෞරව යටහත් පැවතුම්නැති අය නිසාය.

එවැන්නන් සාසනය තුළ ධර්මය නොඅසති. බාහිර වූ අර්ථ රහිත විසිතුරු ආගමික දේසනා ප්‍රිය කරති. ත්‍රිවිධ රත්නයේ ගුණ නොදනිති නොදරති. බුද්ධ රත්නය ආදී ඉහත දැක්වූ කරුණු පහ පිළිබඳව යම්කිසි අවබෝධයක් නැතිකම නිසා ගෞරව යටහත් පැවතුම් නැති අය පහළවේ නම් එවන් සමාජයක ධර්මය අතුරු දහන් නොවී කෙසේ පවතීද ලෝකයා රත්න යයි සලකන වස්තූන්ගේ රත්න ලක්‍ෂණයෝ හෙවත් උසස් ලකුණු පසකි. එය රතන සූත්‍ර අටුවාවේ මෙසේ දැක්වේ.

චිතතීකතං මහගඝංච - අතුලං දුලලහ දසසනං

අනොමසතත පරිභොගං - රතනං තෙන වුචචති

චිත්තා කර්ශණීය වී පුදුමයක් සේ සළකා ගරු කරති , බොහෝ වටී, එයට සමකළ හැකි වෙනත් දෙයක් නැත. දැකගැනීම දුර්ලභය. උසස් සත්වයන් විසින්ම පරිභෝග කරති. මේ ලකුණු පහ ඇත්තේ රත්නයන්ට නම් ත්‍රිවිධ රත්නයද මේ ලක්‍ෂණ පහෙන් යුක්තය. එසේ වූ ත්‍රිවිධ රත්නය පිළිබඳ අවබෝධය නැතිකම නිසා සද්ධර්මය වැනි වූ වෙනත් ආගමික අදහස් අලංකාර ලෙසට සිත් තුලට ඉතා ඉක්මනින් කාවැදෙනු ඇත. එය බුදු දහම ලෙසට ඔවුන් සිතති.

බුදුරජාණන් වහන්සේ පිරිනිවනට පත්වී වසර 2561ක් සපිරීමට ඇත්තේ තව මාසයකි. බුදුරජාණන් වහන්සේ මහා කරුණාවකින් සහ මහාප්‍රඥාවකින් යුතු එකම ශාස්තෘන් වහන්සේය. එවන් උතුමෙකුගේ ගුණ සැමරීමට සූදනම් වනවිට මෙම ආණි සූත්‍රයට අනුව ධර්මයට අනුව සිතා කටයුතු කිරීම උන්වහන්සේට කරන පරම බුද්ධ පූජාවකි. වර්තමානයේ ඇතැමුන් කියන්නේ සමාජයේ ඉල්ලුමට අනුව සැපයුම යනුවෙනි. සමාජය ඉල්ලන්නේ ධර්මයෙන් විනයෙන් තොරවූ යමක් නම් එය ලබාදීම බුදු දහමේ පරමාර්ථය නොවේ. එය ආර්ථික විද්‍යාවේ න්‍යායකි.

රටක අනන්‍යතාවය සඳහා ඒ රටේ නම, ජාතික ගීය, ජාතික ධජය ඇතුවා මෙන්ම බෞද්ධයාට ධර්මයක් විනයක් ඇත. එයින් පරිබාහිර වූ යමක් යමෙක් විසින් ක්‍රියාත්මක කරයි නම් ආණක බෙරයට අත්වූ ඉරණම බුදු දහමටද අත්වේ. අප රටේ ජාතික ධජය භාවිතා කිරීමේදී ඊට අදාළ විනය ක්‍රියාමාර්ග ඇතුවා මෙන්ම බෞද්ධයාටද බෞද්ධ ධජය, ප්‍රතිමාවහන්සේ, ධර්මචක්‍රලාංඡනය දහමට විනයට අනුවම පරිහරණය කිරීමට සිදුවේ. එසේ නොවීමෙන් ආණක බෙරයද ඇණ සැකිල්ලක් වූවාසේ වෙනත් ආගම්වලට වෙස්වලාගැනීමට ඉහත කී පූජනීය වස්තූන් උපයෝගී වීම නොදැනුවත්වම සිදුවේ. එබැවින් ජාතික ධජයට ඇති ගෞරවය අප ජාතියට ඇතුවා මෙන්ම බෞද්ධයාට බෞද්ධ ධජයේ ගෞරවය ආරක්‍ෂා කිරීමට සිදුවේ. බුදුරජාණන් වහන්සේගේ සවනක් රශ්මිය බෞද්ධ ධජයෙන් පිළිඹිඹු වනු ඇත. එය වෙනත් ආගමික දිව්‍ය පූජා උත්සව සහ දන්සැලේ වාහන නතර කිරීම සඳහා භාවිතා කිරීමේදී තව දුරටත් සිතිය යුතුයි නැතහොත් ජනතාව එය ශ්‍රී සද්ධර්මය යයි රැවටී රැස්වී එම කවිකථා, පූජා සන්දර්ශණ වලට ඇහුම් කන්දෙති. කලක් ගතවන විට එයද මහා ඇණයක් වනු ඇත. එවිට සද්ධර්මය අතුරුදන් වේ.

පොහෝ දින අතරින් වෙසක්, පොසොන්, ඇසළ පොහෝ දින බෞද්ධයාට අසහාය පොහෝ දිනයෝය. එය අති උත්කර්ශවත්ව සැමරීම බෞද්ධයාගේ සතුටයි. ශ්‍රී සම්බුදු තෙමගුල, මහින්දගමනය, ප්‍රථම ධම්දේශණය, උපසම්පද විනයකම්, වස්කාලය ආරම්භය වැනි සිද්ධීන් ධර්ම විනය අනුවම ධර්ම අවබෝධයෙන් යුතුව සිහි කිරීමම බුදු දහමේ මූළික හරයට හානි නොවනු ඇත. සමාජය ඉල්ලන දේ බුදු දහමින් නොලැබේ. බුදු දහම යනු සත්‍යට මුහුණ දී සත්වයා දුකින් නිදහස් කිරීමය. එවිට බුදු දහම ඇණ වැදී අතුරුදන් නොවේ. බුදුවරයන්වහන්සේ නමක් ලොව පහළ වන්නේ විශ්වයටම සාධාරණ වූ අනිත්‍ය,දුක්ඛ, අනාත්ම යන කිසිදු ශාස්තෘවරයෙක් හෙළි නොකළ ත්‍රිලක්‍ෂණය හෙවත් හේතු ඵල දහම ලොවට කියාදී ඒ අවබෝධයෙන් අවිද්‍යා අන්ධකාරය නිවා සත්වයා දුකින් සදහටම නිදහස් කිරීමටයි. මූළික එම දැක්ම සෑම බෞද්ධයෙකු තුලම තිබිය යුතුමය. "නිවන් දකිනවා" යන වචනය අද වටිනාකමක් නැති තත්වයට වැටී ඇත. ඒ වචනය උපහාසයට භාවිතා කරන්නේ ආණක බෙරය ඇණවලින් වැසුනාසේ වෙනත් වෙනත් විසිතුරු ආකර්ශණ ඇණ වැදීමෙන් වැසුන අන්ධවූ මුලාවූ සිත් ඇති ඇත්තන්ය.

ධජග්ග සූත්‍රයට අනුව භයක් තැතිගැන්මක් යම්කිසි බුද්ධ ශ්‍රාවකයෙකුට ඇතිවුවහොත් ත්‍රිවිධ රත්නයේ ගුණ මෙනෙහි කරන්නේ නම් එම බිය පහවන බව බුදුරජාණන් වහන්සේ සහතික කරති. ත්‍රිවිධ රත්නය සතු අප්‍රමාණ ගුණස්කන්ධය විසි හතකරට බෙද ඇත. ඒ ලෙසටවත් ගනනින් හෝ නම් වශයෙන්වත් නොදන්නා කෙනෙකුගේ ඇතිවන්නා වූ භය පහවන්නේ කෙසේද? අඩුම වශයෙන් බුදුරජාණන් වහන්සේ "අරහං" ගුණයෙන් යුතුය. ධම්මරත්නය "සවාක්ඛාතය" සංඝරත්නය " සුපටිපන්න" බව නොදන්නා නිසා එවැන්නන්ට ඇතිවන භය දුරු කිරීමට දේවාල තුල ඔවුන් හිර කිරීම යුතුකමක් දැයි කඳණවන්තව විමසිය යුතුය. ධජග්ග සූත්‍රයෙන් බුදුහිමියන් පෙන්වා දුන් බිය තැතිගැන්ම නැමති ගැටලු නැති කරන එකම විසඳුමට ඇණයක් නොගසා සද්ධර්මය විද්‍යමාන කරමු.

තව දින කීපයකින් සිංහල හින්දු අළුත් අවුරුද්ද උදවෙති. ජ්‍යොතිෂ්ශාස්ත්‍රයට අනුව විශ්ව ග්‍රහ වස්තූන් අතර සූය්‍ර ග්‍රහ වස්තුව පිළිබඳ වූ ග්‍රහ සංසිද්ධියක් ඊට මුල්වේ. ජෝතිෂය ශාස්ත්‍රයකි. සමාජ සත්කාරයකි. බුදු දහම සමග බලන කල පමණක් පරම සත්‍ය නොවේ. ජාතික උත්සවයක් ලෙස සිංහල බෞද්ධයාද සළකති එයද වරදක් ලෙසට මෙයින් නොකියම්. මෙයින් පෙන්වා දෙන්නේ එම ජාතික උත්සවයේදී දින කීපයක් අප හින්දූන් නොවෙමු. පුණ්‍ය කාලය යනු ත්‍රිවිධ රත්නය හා සම්බන්ධ වී පිං සිදු කරන කාලයයි. හිසතෙල් ගෑම ත්‍රිවිධ  රත්නයේ ආශිර්වාදයෙන් නිරෝගී කමට හේතු සකස් කර ගැනීමකි. ඉෂ්ඨ දේවතානුස්මරණය යනු ත්‍රිවිධරත්නයේ ගුණ සහ උප්පත්ති දෙවියන් (සතරවරම්, ශක්‍ර, බ්‍රහ්මාදී දෙවියෝ) සිහි කිරීමයි. වැඩිහිටියන්ට ගරු කිරීම තෑගි පිරි නැමීම ආයු වණ්ණ සැප බල ලැබෙන අභිවාදන ක්‍රියාවන්ය. ඒවා බුදු දහමට එකඟ වේ. ඒ අතරට බොහෝ දෙනා ලිපගිනි මෙලවීමේ නැකතට පුරුදු වී ඇත්තේ ගේ මැද ලිපක් හද එළකිරි හෝ පොල් කිරි ඉතිරවීමයි. එසේ උතුරවා ඇස් දෙකෙන් කිරි ඉතිරෙනු දැක සතුටුවී මුට්ටිය පිටින් ඉවතලති. හිඳු දහමට අනුව ඒ කිරි මුට්ටිය මුරුතැන් බතක් කොට දෙවියන් පුදති. ඔවුන්ද අනුභව කරති. අප කරනුයේ බෞද්ධ හෝ හින්දු යන දෙකටම නැති ක්‍රියාවකි. මෙයින්ද ධර්මයට ඇණයක් වනු ඇත. නැනවත් ධර්මගරුක බෞද්ධයාට  සුබ නව වසරකට පමණක් නොව නිවන් දකිනතුරු කිරි ඉතිරෙන මංගල කරුණු මොනවා දැයි මංගල සූත්‍රයෙන් බුදුහිමියන් පෙන්වාදී ඇත. එහි අවසන් ගාථාවෙන් තව දුරටත් පැහැදිලි වන්නේ මෙසේය.

"යම් කෙනෙක් බාලයන් හෙවත් අනුවනයන් ඇසුරු නොකිරීම් ආදී මංගල කාරණයන් කිරීමෙන් හැමද හැමතැනම පරාජයට පත්නොවී සැප දයකව වෙසෙති."

යමෙක් අනුවන මෝඩයන් ඇසුරු කිරීමෙන් ධර්මයෙන් ඈත්වී වෙනත් විශ්වාසයන්ට නැඹුරුවෙති. බෞද්ධයා අද මැදහත්ව සිතා එදිනෙද තම ජීවිත කටයුතු වලදී සිදුකරන ක්‍රියාවන් සමග බලා බුදු දහමට අනුව කොපමණද වෙනත් බාහිර ආගමික මත අනුව කොපමණද බැලුවොත් බුදු දහමට අනුව ඉතිරිවන්නේ ඉතා සවල්පයක් බව තමන්ටම වැටහේ. කොටින් කියන්නේ නම් අපේ ඇතැම් ප්‍රදේශවල බෞද්ධයෝ  අවසානවශයෙන් තම සඳතියෙකුගේ අභාවය සිදු වූ විටක එම දේහය මිහිදන් කිරීමට සහ නිවසින් එළියට ගැනීමට නැකැත් හැදීමට තරම් විශ්වාසයන්ට ගොදුරු වී ඇත. මේ තුළින් පෙනී යන්නේ බොහෝ දුරට අප බෞද්ධයෝ වෙනත් ආගම් වලට වඩා හිඳු ආගමට ගොදුරු වී ඇති බවයි. එනමුත් එම ආගම අදහන ඔවුන් කිසිවිටක බුදුදහමේ කිසිවක් කෙනෙකු මියගිය මොහොතකටවත් අනුගමනය නොකරති. බෞද්ධයෝ ඉගෙන ගන්නා කුඩා දරුවාටද බුදුරජුන්ගේ සර්වඥතා ඥණයට වඩා වෙනත් දෙවිවරුන්ගේ කපටි නුවනෙහි අගය කියා දෙති. ආණක මිහිගු අණබෙරය කලින් කල ඇණ ගැසීම නිසා මුලදී තිබූ බෙරකඳ නොපෙනී හඬ බාල වූවා සේ ලොව්තුරා සද්ධර්මය අතුරු දහන් නොවීමට අප ශ්‍රී සද්ධර්මය  අසමු!. දරමු!. ඒ අනුවම හැසිරෙමු ! යි පුරපෝදින අදිටන් කර ගනිමු.

